# කර්මවාදයේ විකාශය

මහාචාර්ය චන්දිම විජේබණ්ඩාර
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.

'කර්ම' යන වචනයේ තේරුම 'ක්‍රියා' යන්නය. මිනිසුන් විසින් කයින්, වචනයෙන් මෙන් ම සිතින් ද කරනු ලබන ක්‍රියා පිළිබඳ වාදයක් සේ කර්මවාදය හැදින්විය හැකි ය. භාරතයේ හැම ආගමක් ම හැම දර්ශනයක් ම කර්මය පිළිබඳ යම් අදහසක් ඉදිරිපත් කරයි. සමහරු කර්ම වාදය පිළිගනිති. සමහරු ප්‍රතික්ෂේප කරති.

බුදු දහමේ කර්ම වාදයේ මූලික පිළිගැනීම් කවරේදැයි හඳුනා ගන්නට වෑයමක් කළහොත් මුල් ඉගැන්වීම් තුළින් පහත දැක්වෙන අදහස සංග්‍රහ කර ගැනීමට අපට හැකි වෙයි.

1. මිනිසුන් සිතාමතා කරන ක්‍රියා පමණක් කර්ම සංවිභාගය සඳහා වලංගු වෙයි. නො දැන සං චේතනාවකින් තොර ව සිදුවන ක්‍රියා ආචාර විද්‍යාත්මක විනිශ්චය සඳහා සලකා බලනු නො ලැබෙයි. ("චේතනා අහං භික්ඛවේ කම්මං වදාමි." .... සං 11 395 අං 11 157)

2. මිනිසුන් අතර පවත්නා වෙනස්කම් වලට කර්මයේ බලපෑමක් තිබේ. ("කම්මං සත්තෙ විභජති යදිදං හීනප්පණීතතාය" ම. 111 203) මිනිසුන්ගේ ජීවිත තුළ ම කර්මය කොතරම් බලවත් ආකාරයට බැදී ඇත් ද කිවහොත් ඔවුහු කර්මය තම දේපොළ කොට දායදය කොට, ප්‍රභාවය කොට, නෑදෑයා කොට, පිළිසරණ කොට වෙසෙති. ("කම්මස්සකා .... කම්ම දායාදා කම්මයොනි කම්ම බන්ධු කම්ම පටිසරණා" අ. v, 288)

3. කර්මය මිනිසාට බලපාන එකම නියාම ධර්මය නොවේ. සියල්ල සිදුවන්නේ පෙර කර්මය අනුව යන පුබ්බෙකත හේතු වාදය ප්‍රතික්ෂේප කළ යුත්තකි. (ම. 11 , 214 - 288)

4. කර්මය පරාජය කළ යුත්තකි. කර්මය පරදවා භව චක්‍රය බිඳ දමා විමුක්තිය ලැබීමේ ශක්තිය මිනිසා තුළ පවතී. (" යං ඉදන් කම්මං .... තස්සප්පහාණාය යා චේතනා" අං 11 - 132)

5 බුදු දහමේ එන මේ කර්මවාදය භාරතීය ආගම් හා දර්ශන ඉතිහාසයෙහි එතෙක් වැඩී ආ කර්ම සංකල්පය ණයට ගැනීමක්, කොපි කිරීමක් හෝ අනුමත කිරීමක් සේ හඳුන්වන්නට කැමති විචාරකයෝ අපට හමුවෙති.

රාධා ක්‍රිෂ්ණන් (ඉන්දීය දර්ශනය - ලන්ඩන් 1962 I කාණ්ඩය 360 පිටුව ) සහ ඊ. ජේ. තෝමස් (ලංකා විශ්වවිද්‍යාලයීය සඟරාව කොළඹ 1951 පිටුව 216) එසේ පවසා ඇත.

බුදුරාජණන් වහන්සේ වදාරා ඇත්තේ කම්ම නියාමය උන් වහන්සේ විසින් සිය අති මානුෂීය පිරිසිදු නුවණින් යථා තත්ත්වය දැන දැක හෙළි පෙහෙළි කර දැක්වීමක් ලෙසය. (තථාගතො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්ථ මානුසකෙන සත්තෙ පස්සති...... යථා කම්මු පගේ ... ම 1 - 70) කර්ම සංකල්පයෙහි මූලික කරුණු වූ කුසලය, කුසල මූලය, අකුසලය හා අකුසල මූලය දැන ගැනීම සම්මාදිට්ඨියෙහි පළමුවන පියවර බව උන් වහන්සේ සම්මාදිට්ඨි සූත්‍රයෙහි වදාරා ඇත. එහෙයින් මෙම සංකල්පය ප්‍රාග් බෞද්ධ ආගමික පසුබිමෙහි වූ විශ්වාසය උපුටා ගැනීමකැයි බෞද්ධයෝ නොපිළිගනිති.

එතකුදු වුවත් භාරතීය ආගමික දාර්ශනික ඉතිහාසය පිරික්සා බැලීමේදී බෞද්ධ කර්මවාදය ප්‍රාග් බෞද්ධ වූ සංකල්පයන්ගේම විකාශයක් සේ පෙනී යන්නේ නම් බුදුරජාණන් වහන්සේගේ ප්‍රතිජානනය ප්‍රතික්ෂේප කරමින් බුදු සමයෙහි කර්මවාදය භාරතීය අන්‍ය කර්මවාදයන්ගේම පරිණාමයක් බව පිළිගන්නට පරීක්ෂකයකු පෙළඹෙන්නට ඉඩ ඇත. එහෙයින් භාරතීය කර්මවාදයන්හි විකාශය සමීක්ෂණය කර එම අවබෝධය මිනුම කරගනිමින් බෞද්ධ කර්මවාදය දෙස පරීක්ෂණාක්ෂිය යොමු කිරීම වැදගත්ය.

වේද යුගයේ ම භාරතීයයන් අතර කර්ම වාදයක් වූ බව හින්දු ලේඛකයෝ දක්වති. වේදයෙහි දෙවියන් හඳුන්වනු සඳහා විශ්වසෘ කර්මණ ධර්මතා (ලෝකයෙහි කර්මය පිළිබඳ අධිපතියා විචක්ෂණී (හොඳ නරක දක්නා තැනැත්තා) ශුභස්පති (හොඳ වැඩ රකින්නා) යන විශේෂණ පද යොදා ඇත්තේ කර්මය දෙවියන් විසින් පාලනය කරන්නක් නිසාය. පරණ පව් යාග කිරීම මගින් ගෙවා ගත හැකි බව සමහරු ඍෂිවරු සිතූහ. හොඳ වැඩ කරන්නන් ගේ ආත්මය දේව යානයෙන් බ්‍රහ්ම ලෝකයට යන බව ද සාමාන්‍ය කර්ම කරන්නන් පිතෘ යානයෙන් චන්ද්‍රා ලෝකයට යන බවද ඍග්





වේදයේ කියැවේ. (3.38 2 හා 55 - 15) පව් කළ අයගේ ආත්මය ගස්වැල් වලට පිවිසී දුක් විඳින බව ද (ඍග් 7. 9. 3) සමහර අයගේ ආත්මවලට අනුන් ගේ පව් වෙනුවෙන් දුක් විඳින්නට වෙන බව ද වේදයේ කියැවේ. වේද යුගයේ බමුණන් හොඳ කර්ම යැයි විස්තර කෙළේ යාගය යි." "ඉෂ්ටා පූර්ත" නම් වූ යාගයෙන් නිපැයෙන පරලොවට ගෙන යන බලවේගයක් ගැන ඔවුහු විශ්වාස කළහ.

**සංගච්ඡස්ව පිතෘභිඃ සංයමෙනෙෂ්ටා පූර්තේන පරමේ ව්‍යොමන් හිත්වා යාවද්‍යං පුනරස්තමෙහි සංගච්ඡස්ව කත්වා පුනර්වාඃ (ඍග් 10 - 14)**

මේ අදහස උපනිෂද් මුනිවරු වර්ධනය කළහ. ඔවුහු යහපත් වැඩ කරන අයට යහපත් විපාක ලැබෙන බව ද අයහපත් වැඩ කරන අයට අයහපත් විපාක ලැබෙන බව ද වඩාත් පැහැදිලි අයුරින් අවධාරණය කළහ.

"යථාකාරී යථාචාරී තථා භවති. සාධුකාරි සාධුර් භවති පාපකාරි පාපො භවති. පුණ්‍යං පුණ්‍යෙන කර්මණා භවති පාපංඃ පාපෙන අතො බල්වාහුඃ කාමමය ඒවයං පුරුෂ ඉති ස යථා කාමො භවති තත් ක්‍රතුර් භවති යත් ක්‍රතුර් භවති තත්කර්ම කුරුතේයත් කර්ම කුරුතෙ තදභි සම්පද්‍යතේ "

"කරන දේ අනුව හැසිරෙන ආකාරය අනුව විපාක ඇති වේ. හොඳ කළ විට හොඳ විපාක ලබන්නේ වෙයි. පව් කළ විට පාප විපාක ලැබෙයි. පින්වතකු ඇති වන්නේ පින්කම් කිරීම තුලින් පව්කාරයෙක් පව් කිරීම තුළින් ඇති වේ. මිනිසා කාමය හෙවත් කැමැත්ත මගින් මෙහෙයවනු ලැබේයැයි කියන්නේ එහෙයිනි. කැමැත්තක් ඇති වූ විට කිරීමට පෙළඹේ. කිරීමට පෙළඹීමක් පෙළඹීමෙන් කරයි. කළ දේ අනුව පල දෙයි." බෘහදාරණ්‍යකොපනිෂද් 4 - 4 - 5)

මේ විස්තරය ඖපනිෂදික දර්ශන සංදර්භය තුළ අපට පහත දැක්වෙන පණිවිඩය පවසයි.

"කර්මය අපේ සංසාර ප්‍රවෘත්තිය පිළිබඳ මූලික සාධකයකි. අපගේ හිතා මතා කරන ක්‍රියාවලින් පුනර්ජන්මය කෙරේ බලපෑමක් ඇති කෙරෙයි.

**මෙම කර්මවාදය බුදු දහමට ඉතා සමීප නොවේදැයි මෙහි දී ක්ෂණික හැඟීමක් අපතුළ ඇතිවිය හැකි ය. එහෙත් මෙම කර්මවාදය උපනිෂද් චින්තනයේ ආත්ම සංකල්පය හා බැඳී ඇති අයුරු අමතක නො කළ යුතුය.** අපට නිත්‍ය

අවිනශ්වර භවගාමී ආත්මයක් ඇති බව උපනිෂද් දර්ශනයේ ඉගැන්වෙයි. කුඩැල්ලා එක් තණ පතක් අතහැර තව තණ පතක් අල්ලා ගන්නා ලෙස ආත්මය එක් ශරීරයක් වෙත පිවිසෙයි.

> තද්‍යථා තෘණ ජලායුකා ෘ තෘණස්‍යාන්තං ගත්ත්වාන්‍ය
> මාක්‍රම්‍ය මාක්‍රම්‍යාත්මාන මුපසංහරති එවමෙ වායමා
> ත්මෙදං ශරීරං නිහත්‍යා විද්‍යාං ගමයිත්වාන්‍ය
> මාක්‍රම මාක්‍රම්‍යාත් මානමුපසංහරති"

"කුඩැල්ලා තණ පත අගට ගොස් වෙනත් තණ පතක් අල්ලා ගෙන එයට තමා ඇද ගන්නා ලෙසින් මේ ආත්මය මේ ශරීරය අතහැර එය අසංඳිකර වෙන ශරීරයකට පිවිස එයට පිවිසෙයි."

(බෘහදාරකඋපනිෂද් 4 - 4 - 3)

ඒ අනුව ආත්මය කර්මයේ කර්තෘ හා භෝක්තෘ වෙයි. කර්ම කරන්නා විපාක විඳියි. මේ සංකල්පය ශාස්වත වාදය නම් මිථ්‍යා දෘෂ්ටිය බව බුදු රජාණන් වහන්සේ පෙන්වා දුන්හ. (සො කරොති සො පටිසංවේදියතිති " සස්සතං ඒතං පරෙති)

**ජෛන ආගම භාරතයේ තවත් සුප්‍රකට හා කර්ම සංකල්පයක් ඉදිරිපත් කළ ආගමකි.** ජෛන ධර්මය අනුව අපි සියලු දෙනාම භවගාමී පෞද්ගලික ආත්ම ඇත්තේ වෙමු. අපගේ එම ආත්ම වටා බැඳුණු ක්ලේශ නිසා අපි ලෝකාකාශයේ රැඳී අපගේ කර්ම විපාකය අනිවාර්යයෙන් විඳ ගත යුතුව දුක් විඳිමු. පුබ්බේකත හේතුවාද වශයෙන් බෞද්ධ පොත් පත්වල වාර්තා කර ඇති මෙම වාදය අපගේ සෑම ක්‍රියාවක් ම කර්ම නිසාම සිදු වන බවට පත් කරයි. හිතා මතා අළුතෙන් ක්‍රියා කිරීමට අපට ඇති අයිතිය මෙ මගින් අහෝසි වෙයි.

**ලෝකායතික භෞතික වාදීහු කර්ම විපාක පිළිබඳ සංකල්පය සහමුලින්ම ප්‍රතික්ෂේප කළහ.** එහෙයින් පුණ්‍ය පාප විපාක පිළිබඳ බලපෑමකින් තොරව සියල්ලන්ම උච්ඡේද වන බව ඔවුහු පැවසූහ. **ආජීවකයන් ගේ නියති සංගති භාව පරිණාම වාදය ද පකුධ ගේ මූල ධාතු (අනු) වාදයද කර්මවාදයට පටහැනි ඉගැන්වීම් වෙයි.**

මේ අයුරින් කර්ම වාදයේ විකාශය පිරික්සන සමීක්ෂකයෙකුට පෙනී යන්නේ බුදු සමයට පෙර භාරතයේ කර්ම සංකල්පයක් ඉදිරිපත් කළේ වෛදික





සම්ප්‍රදායට අයත් චින්තනයන් හා ජෛනයන් පමණක් බවය. අනෙකුත් දාර්ශනිකයෝ එය ප්‍රතික්ෂේප කළහ. එහෙයින් බුදුරදුන් කර්මවාදය කොපිකර ගත්තායයි චෝදනා කරනු රිසි නම් ඒ සඳහා පූර්වෝක්ත දෙපක්ෂයේ කර්ම සංකල්ප සම්බන්ධකර ගත යුතු වෙයි.

මෙහිදී පූර්වොක්ත කර්මවාද හා බුදුසමයේ කර්ම වාදය අතර යම්කිසි පොදු උරුමයක් පවතී ද යනු පිරික්සීම අතිශයින් වැදගත් වෙයි. වෛදික හා ජෛන කර්මවාද දෙකෙම දෙවිදියක ආත්ම සංකල්ප හා බැඳී පවතියි. වෛදික ආත්ම සංකල්පයේ පවත්නා ජගදාත්ම ස්වරූපය ජෛනයෝ නො දක්වති. ඒ ඒ පුද්ගලයන් සතු ප්‍රත්‍යෙක ආත්ම පිළිබඳව ඔවුහු විශ්වාස කරති. දෙපක්ෂයම ශාස්වත වාදීන් ව ස්ථිර භවගාමී ආත්මයක් පිළිබඳව ප්‍රතිජානනයක යෙදෙති.

කර්මය මෙම ආත්ම හා අනිවාර්යයෙන්ම බැඳි පවතියි. එහෙත් **බුදු සමය මේ තත්ත්වයෙන් මුළුමනින් බැහැරව කිසිම ආකාරයක නිත්‍යතාවක් ප්‍රතික්ෂේප කරමින් අනාත්මවාදී සන්දර්භයක් තුළ කර්මවාදය ඉදිරිපත් කරයි.**

එහෙයින් එහි දාර්ශනික ගුණය මුළුමනින්ම වෙනස් වෙයි. භාරතීය දර්ශනය පිළිබඳ පත පොත රචනා කරන හින්දු ලේඛකයන් බුදුසමය නාස්තික දර්ශන පවුලට අයත් බව ද ඔවුන්ගේ චින්තනය ආස්තික දර්ශන පවුලට අයත් බවද පවසන්නේ එහෙයිනි.

**ජෛනයන් හා බ්‍රාහ්මණයන් කර්මය මනුෂ්‍යයාට වඩා බලවත් , පරාජය කළ නොහැකි සාධකයක් සේ දක්වන බව පෙනේ.** ජෛනයන් උපක්‍රමික දුක් විඳ ගනිමින් කරන්නේ කර්මයට තම ස්වාධීනත්වය ස්වෙච්ඡාවෙන්ම පවරා දීමකි. දඬුවම ඉල්ලා ලබා ගැනීම තුළින් ඉක්මන් විමුක්තියක් පැතීමකි. එහෙත් බුද්ධසමය කර්මය ජය ගත හැකි , ජයගත යුතු බලවේගයක් සේ උගන්වයි. විමුක්තිය ලැබීම සඳහා කර්මක්ෂය කළ යුතු නැත. කළ යුත්තේ තෘෂ්ණාක්ෂය පමණි. කර්ම ඉතිරි වුව ද තෘෂ්ණාව මූලෝත්පාටනය කිරීම තුළින් විමුක්තිය ලද හැක.

**බුදු සමයෙහි කුශලා කුශල කර්ම පිළිබඳව දැක්වෙන මනෝ විද්‍යාත්මක විවරණය භාරතිය අන්‍ය කර්ම වාදවල දක්නට නොලැබේ.** වෛදිකයෝ යාගයෙහි ආකෘතික විධාන තුලින් කර්ම ශක්තිය ජනිත වෙතැ යි සිතූ අතර ජෛනයෝ එය ක්‍රියාවෙහි භෞතික අංගය හේතු වෙන් ජනනය වන පරමාණු වැනි භෞතික වූ ගුරුත්වයක් ඇත්තා වූ දැවියහැකි පදාර්ථයක්

සේ සිතූහ. බුදු සමය කර්මය මානසික බලවේගයක් සේ ගෙන ඊට පදනම් වන චේතනාව විභාග කිරීම තුළින් විපාකයේ ස්වරූපය විනිශ්චය කිරීමට පෙළඹෙයි. එවැනි අධ්‍යාත්මික වූ මනෝ විද්‍යාත්මක වූ විවරණයක් ඉන් පෙර ඉදිරිපත් නො වීය.

**භාරතීය කර්ම සංකල්පයේ විකාශනය තුළ බුදු සමය නිරූපනය කරන්නේ අනුකාරකයකු හෝ අනුයෝජකයකු විද්‍යාමාන කරන ස්ථාවරයක් නොව විචාරශීලි යථාර්ථ නිරූපකයෙකු දරන** ස්ථාවරය යි. සාවද්‍ය පදනමක් මත පිහිටි හොඳ නරක විමසුම සම්‍යක් සම්බෝධියෙන් ලද ස්වයං ප්‍රතිභාන ඥානය අනුව යථාභූත ස්වභාවය ගුරු කරගෙන අළුතෙන් ම උදා කිරීමක් බෞද්ධ කර්ම සංකල්පය තුළින් දිස්වෙයි. කර්මවාද විකාශයේ අනිවාර්ය තාර්කික වර්ධනයකට වඩා අපෝහක ප්‍රතිඵලයක් එයින් දිස්වෙතැයි පැවසීම වඩා යෝග්‍ය වෙයි.